**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2015**

**------------------------------------------------**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------**

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1. වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

**-------------------------------------**

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2014 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | වටිනාකම |
|---|---|
| <u>වත්කම්</u> | රු. |
| ජංගම නොවන වත්කම් | 16,752,897 |
| ජංගම වත්කම් | 2,492,381 |
| | ------------- |
| මුළු වත්කම් | 19,245,278 |
| | ======= |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 3,705,071 |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 13,840,972 |
| ජංගම බැරකම් | 1,699,235 |
| | ------------- |
| මුළු බැරකම් | 19,245,278 |
| | ======== |

| | |
|---|---|
| මුළු ආදායම | 30,592,712 |
| මුළු වියදම | 27,064,820 |
| | --------------- |
| අතිරික්තය | 3,527,892 |
| | ======== |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳව ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 115(ආ) | ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදනයන්ගෙන් ඉකුත් ගෙවීම් සඳහා නිසි අධිකාර බලයලත් නිලධාරියෙකුගේ සහතිකය මත ගෙවීම් කළ හැකි වුවද රු.197,106 ක් වූ ඉකුත් ගෙවීම සඳහා එලෙස අධිකාරි බලය ලබාගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 257 | සහතික කල වවුචර් සඳහා පමණක් ගෙවීම් කළයුතු බව දක්වා තිබුණද රු.197,106 ක් වූ පුවත්පත් දැන්වීම් ගාස්තු ගෙවීමට අදාල ගෙවීම් වවුචරය සහතික කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 371 සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | නිලධාරියෙකුට ලබාදුන් අත්තිකාරමක් දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් 2015 වර්ෂය තුල අවස්ථා 30 කදී ලබාදී තිබූ රු.1,173,164 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (v) මුදල්රෙගුලාසි 756 | අධිකාරියේ බඩු බාහිරාදිය හා ස්ථාවර වත්කම් පිළිබඳව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) 2003 ජූලි 24 දිනැති අංක 112 දරන ජාතික අයවැය චක්‍රලේඛය | වාහන දෙකක් මිලදී ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්යසාධනය

------------------

2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත අනුව අධිකාරියේ අරමුණු පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකාව තුළ කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය උනන්දු කරවීම, වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම.

(ආ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම.

(ඇ) උචිත ලෙස සකස් කරන ලද ප්‍රතිපත්ති, සැළසුම්, උසස් කිරීමේ දිරිදීමනා සකස් කිරීම සහ කාර්මික සහ කෘෂි කර්මාන්තයේ වෙළඳාම සහ සංවර්ධනය සඳහා සක්‍රීය ලෙස උපකාර කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීම.

(ඈ) ව්‍යවසාය සංවර්ධනයේ අත්‍යාවශ්‍ය සංරචකයන් ලෙස තාක්ෂණික නිපුනතා සමග මානව ප්‍රාග්ධන සංවර්ධනය ජනතාව තුළ ඇති කිරීම.

(ඉ) සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(ඊ) ව්‍යවසාය සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම සඳහා ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීම.

(උ) තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාළ පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

(ඌ) ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.

### 3.2 සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි විය.

(අ) දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ සුළු පරිමාණ ව්‍යවසායකයින්, ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් හා ආයෝජකයන් හඳුන්වා දී ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේදී මුහුණ පෑමට සිදුවන ගැටළු නිරාකරණය කිරීමට මඟපෙන්වීම සඳහා රු.1,200,000 ක් වැයකර දිවයිනේ සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආවරණය වන පරිදි ප්‍රාදේශීය ව්‍යාපාර සංසඳ පැවැත්වීමට අපේක්ෂා කළද ප්‍රාදේශීය ව්‍යාපාර සංසද 77 ක් පමණක් පිහිටුවා තිබූ අතර එය අපේක්ෂිත අරමුණෙන් සියයට 30 ක් විය.

(ආ) රාජ්‍ය හා පෞද්ගලික මට්ටමේ ව්‍යවසායකයින්, ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්, මූල්‍ය හා අනෙකුත් සේවා සපයන්නන්, ආයෝජකයන්, විවිධ උනන්දුවක් දක්වන පාර්ශවයන් ආදී කණ්ඩායම් රැසක් ඒකරාශී කොට ජාතික මට්ටමින් ව්‍යාපාර සාකච්ඡා පැවැත්වීම මගින් එම පාර්ශවයන් අතර අන්තර්ජාලකරණය සිදු කිරීම අරමුණු කර රු.200,000 ක වැඩසටහනක් ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ සාකච්ඡා කිසිවක් පවත්වා නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගැටළු විසඳීම අරමුණු කරගෙන සමාලෝචිත වර්ෂය තුළදී ආසියා පදනම සමඟ සම්බන්ධ වී "Issue Tracker" මෘදුකාංගය ස්ථාපිත කර තිබුණද වර්ෂය අවසාන වන විට රු.48,000 ක් වැයකර දිස්ත්‍රික්ක 3 ක පමණක් නියමු වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 40 ක් පමණක් විය.

(ඈ) ව්‍යවසායකයින් සඳහා තාක්ෂණය, මූල්‍ය පිවිසුම, ව්‍යාපාර නීතිය ආදී ක්ෂේත්‍ර සඳහා ව්‍යවසායකත්ව දැනුම ලබාදීම සඳහා වර්ෂය තුළදී "දිරියට සවිය" රූපවාහිනී වැඩසටහන මාසිකව 1 ක් බැගින් වැඩසටහන් 12 ක් පැවැත්වීමට ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණද වැඩසටහන් 7 ක් පමණක් පවත්වා තිබුණු අතර ඒ සඳහා රු.2,352,180 ක් වැයකර තිබුණි. මෙම වැඩසටහන් මඟින් අදාළ අරමුණු ඉටුවී ඇති බවට පසුවිපරම් කිරීමක් අධිකාරිය විසින් සිදු කර ඇති බව නිරීක්ෂණය නොවුණි.

(ඉ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සඳහා තොරතුරු ලබාදීමේ අරමුණින් ප්‍රවෘත්ති පත්‍රිකා 3 ක් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කර තිබුණද එක් ප්‍රවෘත්ති පත්‍රිකාවක් පමණක් නිකුත් කර තිබුණි.

(ඊ) යුද්ධයෙන් අවතැන්වූ වැන්දඹුවන් සාර්ථක ව්‍යවසායකයින් බවට පත්කර ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණින් වැන්දඹුවන් සියදෙනෙක් තෝරාගෙන ඔවුන්ට මඟපෙන්වීම සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ වැඩසටහනෙන් සමාලෝචිත වර්ෂය තුළ අත්පත්කරගත් භෞතික ප්‍රගතිය සියයට 30 ක් පමණක් විය.

(උ) කුරුණෑගල, නුවර, මන්නාරම හා මඩකලපුව යන දිස්ත්‍රික්ක 4 පාදක කරගෙන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කළ තරඟකාරී ව්‍යාපාර සැලසුම් හා ගැටළු හඳුනාගැනීමේ වැඩසටහන සමාලෝචිත වර්ෂය තුළදී අත්හිටුවා තිබුණු අතර ඒ සඳහා රු.603,459 ක් වැයකර තිබුණි.

(ඌ) ප්‍රාදේශීය ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් හා සුළු පරිමාණ ව්‍යවසායකයින් සුළු පරිමාණ ව්‍යාපාර පිළිබඳ දැනුවත් කිරීම සහ අවශ්‍ය සම්පත් සුලභ කිරීමේ අරමුණෙන් දිස්ත්‍රික් මට්ටමින් සුළු පරිමාණ ව්‍යාපාර පිළිබඳ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා 2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය වර්ෂය අවසාන වන විට අවසන් කර නොතිබුණු අතර එහි භෞතික ප්‍රගතිය සියයට 30 ක් පමණක් විය.

(එ) තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම මගින් සමාලෝචිත වර්ෂයේදී Hand operated milking machine, Aricunut sheath cups, Tender Coco, De husking machine හා Banana Fiber and thread යන යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම, වැඩසටහනට ඇතුළත් කර ඇතත් රු.334,142 ක් වැයකර Hand operated milking machine එකක් පමණක් හඳුන්වා දී තිබුණු අතර එය වැඩසටහනේ භෞතික ප්‍රගතියෙන් සියයට 30 ක් විය.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී "Technology Transfer Program" වැඩසටහන් 2 ක් ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණද කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබූ අතර එය ඊළඟ වර්ෂය සඳහා කල්දමා තිබුණි. කෙසේ වෙතත් මෙම වැඩසටහන සඳහා රු.26,424 ක් වර්ෂය තුළ වැය කර තිබුණි.

(ඔ) 2015 වර්ෂයේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ජාත්‍යන්තර මට්ටමින් සමුළුවක් පැවැත්වීම ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත කර තිබුණද එම වැඩසටහන අවලංගු කර තිබුණි.

## 3.3 කාර්යමණ්ඩල පරිපාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 32 දෙනෙකු වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 22 දෙනෙකු වීමෙන් පුරප්පාඩු 10 ක් පැවති අතර 2017 වර්ෂයේදී එම පුරප්පාඩු වලින් 02 ක් පමණක් පිරවීමට කටයුතු කර තිබුණි.

(ආ) අධිකාරියේ රියදුරෙකු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණු අතර 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඔහුට වැටුප් හා දීමනා ලෙස රු.961,223 ක් ද අතිකාල හා ගමන් වියදම් ලෙස රු.225,035 ක් ද අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(ඇ) අධිකාරිය ඇති කිරීමේ අරමුණු ඉටුකර ගැනීමෙහිලා ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර තනතුරු සෘජුවම බලපානු ලබන බැවින් එම අනුමත තනතුරු 08 ම පුරප්පාඩුව තිබීම අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිව තිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම | (i) හානි පිළිබඳව ලේඛනයක් පවත්වා නොතිබීම.<br>(ii) විගණන විමසුම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) අත්තිකාරම් | අත්තිකාරම් පියවීම ප්‍රමාද වීම |